# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT

# 2023



## භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
## திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
## Department of Treasury Operations


මුදල්, ආර්ථික ස්ථායීකරණ හා
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
කොළඹ 01

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும்
தேசிய கொள்கைகள் அமைச்சு
கொழும்பு 01

Ministry of Finance, Economic
Stabilization and National Polices
Colombo 01.

**භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

# වාර්ෂික කාර්යසාධන වාර්තාව 2023

**වැය ශීර්ෂය : 249**

**එච්.සී.ඩී.එල්.සිල්වා**
**අධ්‍යක්ෂ ජනරාල්**
**භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව**
**011-2484729**
**dgto@tod.treasury.gov.lk**

# පටුන


පිටුව

**පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය**

1.1 හැඳින්වීම 01

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 01 - 02

1.3 ප්‍රධාන කාර්යයන් 02

1.4 සංවිධාන සටහන 03

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 04

**පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම** 05-07

**පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 08

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 09

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 10

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 11

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 12-13

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය 14

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 14

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 15

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 15

**පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව) 16

**පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 17

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 18

**පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 19

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපෑම 20

6.3 මානව සම්පත් සංවර්ධනය 21-26

**පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව** 27-32

# 01. පරිච්ඡේදය- ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

ඒකාබද්ධ අරමුදල් කළමනාකරණයට හා රාජ්‍ය ණය කළමනාකරණයට අදාළ කරුණු සම්පාදනයට කාර්යක්ෂම සංවිධාන ව්‍යුහයක් භාණ්ඩාගාරය තුළ ඇති කිරීම අරමුණු කරගෙන 2004 ජුලි 28 දින භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. ඒ අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ජාතික අයවැය තුළ පුරෝකථනය කරන ලද ආදායම් සහ වියදම්, මෙහෙයුම් මුදල් ගලායැම් හා ගලා ඒම් බවට පරිවර්තනය කිරීමට කටයුතු කරන අතර, වාර්ෂික ණය ගැනීමේ වැඩසටහන මඟින් මූල්‍යනය කළයුතු අයවැය හිඟය හඳුනා ගැනීමටද කටයුතු කරයි. දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ණය කළමනාකරණ කටයුතු තුළ ණය සේවාකරණය හා වාර්තා කිරිමේ කටයුතුද ඇතුළත් වන්නේය.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

" රාජ්‍ය අරමුදල් කළමනාකරණයේ දකුණු ආසියානු කලාපයේ විශිෂ්ටතමයා බවට පත්වීම "

**මෙහෙවර**

"අරමුදල් ගිණුම්කරණය හා රාජ්‍ය ණය ගිණුම්කරණය පිළිබඳ භාරකාරත්වය දරමින්, රාජ්‍ය වැය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ අරමුදල හා වෙනත් භාණ්ඩාගාර අරමුදල් කාර්යක්ෂමව හා අරපිරිමැස්මෙන් උපයෝගී කර ගැනීමද, ආදායම් එකතු කිරීම් හා රාජ්‍ය ණය ගැනීම් සම්බන්ධව සම්බන්ධීකාරකයෙකු ලෙස ක්‍රියා කිරීම සඳහා ද කැපවීම."

**අරමුණු**

- විධිමත් භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ කළමනාකරණය තුළින් වාර්ෂිකව ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය වියදම් දැරීමේ සියළුම නියෝජිත ආයතන වෙත අවශ්‍ය අරමුදල් සලසාලමින් පහසුකම් සැපයීම.

- විදේශ මූල්‍යනය සහිත ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාර මට්ටමින් අරමුදල් බෙදාහැරීම සහ මූල්‍ය/ගිණුම් වාර්තාකරණය සඳහා පහසුකම් සැපයීම.

- රාජ්‍ය ආදායම ඇතුළුව සියළුම ලැබීම් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් නිල බැංකු ගිණුමට දෛනිකව රැස් කිරීම පහසු කරනු වස් භාණ්ඩාගාර කේවල ගිණුම් ක්‍රමය වැඩිදියුණු කිරීම / ව්‍යාප්ත කිරීම.


- ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වෘත්තීයමය භාවයකින් යුක්තව නිලධාරින්ගේ කාර්ය සාධනය සහතික කරමින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ධාරිතා මට්ටම වර්ධනය කිරීම.

- ආයතනයේ අවශ්‍යතාවයන් සපුරාලීම පෙරදැරිකරගෙන ජාතික / අන්තර් ජාතික ප්‍රමිත මට්ටම් ලබා ගැනීමට පහසුවන පරිදි අදාළ ප්‍රමිතීන් ආයතනික අවශ්‍යතාවයන්ට ගැලපෙන ලෙස සංශෝධනය කරමින් දෙපාර්තමේන්තු කාර්යය ශ්‍රිතයන් / ක්‍රියාවලින් ප්‍රමිතිකරණය කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ කළමනාකරණය.
- ගෙවීම් පද්ධතිය හරහා භාණ්ඩාගාර අරමුදල් උපයෝජනය කිරීම.
- වියදම් ආයතනවල අරමුදල් අවශ්‍යතා තක්සේරු කර ප්‍රමුඛතා මත අරමුදල් නිදහස් කිරීම.
- භාණ්ඩාගාර ඇපකර නිකුත් කිරීම.
- රජයේ උපණය අයකිරීම සහ ඊට අදාළ භාණ්ඩාගාර පොත්පත් පවත්වාගෙන යාම.
- දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති බදු නොවන ආදායම් ශීර්ෂ 12 ක් යටතේ ආදායම් ඇස්තමේන්තු කිරීම, අනෙකුත් අමාත්‍යාංශයන් දෙපාර්තමේන්තු විසින් කළ එකතු කිරීම්ද ඇතුළත්ව ආදායම් ගිණුම පිළියෙල කිරිම.
- විදේශ ආධාර ණය සහ ප්‍රදාන යටතේ ලැබෙන මුදල් අදාළ ව්‍යාපෘති වෙත නිකුත් කිරීම සඳහා පහසුකම් සැලසීම.
- විදේශ ආධාර ගිණුම් තැබීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීම.
- රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම්ගත කිරීම.
- රජයේ බැංකු ගිණුම් සහ අග්‍රිම ගිණුම් ආරම්භ කිරීම/පවත්වාගෙන යාම සඳහා බලය දීම හා අධීක්ෂණය කිරීම.
- රාජ්‍ය නිලධාරීන්ගේ දේපල ණය ඇප යෝජනා ක්‍රමය මෙහෙය වීම.

## 1.4 සංවිධාන සටහන



අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මුදල් ප්‍රවාහ කළමනාකරණ හා ආදායම්) (ශ්‍රී ලං.ග.සේ.)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (රාජ්‍ය ණය කළමනාකරණ හා ප්‍රතිසංස්කරණ) (ශ්‍රී ලං.ග.සේ.)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ) (ශ්‍රී ලං.ග.සේ.)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන,අසම්භාව්‍ය බැරකම් හා ගෙවීම් ක්‍රමවේද ප්‍රතිසංස්කරණ) (ශ්‍රී.ලං.ප.සේ.)
අධ්‍යක්ෂ (ආදායම්) (ශ්‍රී ලං.ග.සේ.)
අධ්‍යක්ෂ (මුදල් ප්‍රවාහ කළ.) (ශ්‍රී ලං.ග.සේ.)
අධ්‍යක්ෂ (දේශීය ණය) (ශ්‍රී ලං.ග.සේ.)
අධ්‍යක්ෂ (විදේශ ණය-01) (ශ්‍රී ලං.ග.සේ.)
අධ්‍යක්ෂ (දේශිය/ විදේශීය ප්‍රදාන) (ශ්‍රී ලං.ග.සේ.)
අධ්‍යක්ෂ (විදේශ ණය-02) (ශ්‍රී ලං.ග.සේ.)
අධ්‍යක්ෂ (ඒකාබද්ධ අරමුදල් කළ.) (ශ්‍රී ලං.ග.සේ.)
අධ්‍යක්ෂ (අරමුදල් මෙහෙයුම් හා ගිණුම්) (ශ්‍රී ලං.ග.සේ.)
අධ්‍යක්ෂ (උප ණය හා භාණ්ඩාගාර ඇපකර) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ. (ආදායම්.) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ. (මුදල් ප්‍රවාහ කළ.) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ. (දේශීය ණය) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ. (විදේශ ණය-01) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ. (ප්‍රදාන) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ. (අයවැය ක්‍රි.කි. 1) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ (අයවැය ක්‍රි.කි.2 ) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ (අයවැය ක්‍රි.කි-3) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ (අයවැය ක්‍රි.කි.-4) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ. (සැපයුම් හා ගිණුම්) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ. (පාලන) (ශ්‍රී.ලං.ප.සේ.)
පරිපාලන නිලධාරී

## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- **ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ හා ගිණුම් අංශය**
  - ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ ඒකකය
  - අයවැය ක්‍රියාත්මක කිරීමේ අංක 01,02,03 සහ 04 ඒකකයන්
  - අරමුදල් මෙහෙයුම් හා ගිණුම් ඒකකය
  - සැපයුම් හා ගිණුම් ඒකකය

- **රාජ්‍ය ණය කළමනාකරණ හා ප්‍රතිසංස්කරණ අංශය**
  - විදේශ ණය 01 ඒකකය
  - විදේශ ණය 02 ඒකකය
  - දේශීය ණය ඒකකය
  - දේශීය හා විදේශීය ප්‍රදාන ඒකකය

- **මුදල් ප්‍රවාහ කළමනාකරණ හා ආදායම් අංශය**
  - මුදල් ප්‍රවාහ කළමනාකරණ ඒකකය
  - ආදායම් ඒකකය

- **පාලන, අසම්භාව්‍ය බැරකම් හා ගෙවීම් ක්‍රමවේද ප්‍රතිසංස්කරණ අංශය**
  - උපණය හා භාණ්ඩාගාර ඇපකර කළමනාකරණ ඒකකය
  - නව ආර්ථික ප්‍රවණතා මත දෙපාර්තමේන්තු විෂය පථය සැලසුම් කිරීමේ ඒකකය
  - තොරතුරු තාක්ෂණ සංවර්ධන ඒකකය
  - භා.නි.ලේ.ගේ වත්කම් හා සුරක්ෂිතාගාර කළමනාකරණ ඒකකය
  - පාලන ඒකකය

## 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

➢ විශේෂ ජයග්‍රහණ

I. 2016 මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පවත්වන ලද කාර්ය සාධන ඇගයීම් වැඩසටහනේ දෙපාර්තමේන්තු කාණ්ඩය යටතේ ලංකාවේ ප්‍රථම ස්ථානය සඳහා වූ රන් පදක්කම.

II. 2017 මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පවත්වන ලද කාර්ය සාධන ඇගයීම් වැඩසටහනේ දෙපාර්තමේන්තු කාණ්ඩය යටතේ ලංකාවේ ප්‍රථම ස්ථානය සඳහා වූ රන් පදක්කම දිනා ගැනීම.

III. 2018 මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පවත්වන ලද කාර්ය සාධන ඇගයීම් වැඩසටහනේ දෙපාර්තමේන්තු කාණ්ඩය සම්මානය.

IV. 2019 මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පවත්වන ලද කාර්ය සාධන ඇගයීම් වැඩසටහනේ දෙපාර්තමේන්තු කාණ්ඩය යටතේ සම්මානය ලබා ගැනීම.

V. 2020 මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පවත්වන ලද කාර්ය සාධන ඇගයීම් වැඩසටහනේ දෙපාර්තමේන්තු කාණ්ඩය යටතේ ඉහළ කාර්යසාධන මට්ටමක් ළඟා කර ගැනීම.

VI. 2018 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්ය සාධනය මත සත්‍ය හා සාධාරණ විගණන මතයක් විගණකාධිපති වෙතින් ලබා ගැනීම.

VII. 2019 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්ය සාධනය මත සත්‍ය හා සාධාරණ විගණන මතයක් විගණකාධිපති වෙතින් ලබා ගැනීම.

VIII. 2020 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්ය සාධනය මත සත්‍ය හා සාධාරණ විගණන මතයක් විගණකාධිපති වෙතින් ලබා ගැනීම.

IX. 2021 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්ය සාධනය මත සත්‍ය හා සාධාරණ විගණන මතයක් විගණකාධිපති වෙතින් ලබා ගැනීම.

X. 2022 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්ය සාධනය මත සත්‍ය හා සාධාරණ විගණන මතයක් විගණකාධිපති වෙතින් ලබා ගැනීම

XI. කොවිඩ් - 19 වසංගත තත්වය යටතේ නිලධාරීන්ට නිවසේ සිට රාජකාරි කිරීමට පහසුකම් සැලසීම සඳහා මාර්ගගත පද්ධතියක් ලෙස "භාණ්ඩාගාර මූල්‍ය කළමනාකරණ පද්ධතිය" (TFMS) වැඩි දියුණු කිරීම.

XII. ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) යටතේ සියළුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා අක්මුදල් නිදහස් කිරීම සහ එකී කාර්යයන් සාර්ථකව කළමනාකරණය කිරීම.

XIII. ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමය (APFASL) විසින් සංවිධානය කරන ලද රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තු කාණ්ඩය යටතේ 2019 වසරේ දී රාජ්‍ය අංශය සඳහා හොඳම වාර්ෂික වාර්තා සහ ගිණුම් සම්මාන උළෙලේ තෙවන ස්ථානය සඳහා ලෝකඩ සම්මානය දිනා ගන්නා ලදී.

XIV. ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමය (APFASL) විසින් සංවිධානය කරන ලද රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තු කාණ්ඩය යටතේ 2020 වසරේ දී රාජ්‍ය අංශය සඳහා හොඳම වාර්ෂික වාර්තා සහ ගිණුම් සම්මාන උළෙලේ තෙවන ස්ථානය සඳහා ලෝකඩ සම්මානය දිනා ගන්නා ලදී.

XV. ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමය (APFASL) විසින් සංවිධානය කරන ලද රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තු කාණ්ඩය යටතේ 2022 වසර සඳහා රාජ්‍ය අංශය සඳහා වූ වාර්ෂික වාර්තා සහ ගිණුම් සම්මාන උළෙලේ දී අනුකූලතා සහතිකයක් දිනා ගන්නා ලදී.

අභියෝග

I කලාපයේ අනෙකුත් රටවල් විසින් හඳුන්වා දෙනු ලබන භාණ්ඩාගාර ප්‍රතිසංස්කරණ හා තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයන් නිසා මෙරටට ඇතිවන බලපෑම.

II උපාය මාර්ගික මට්ටමේ නිලධාරීන් ඇතුළු දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත්වන දීප ව්‍යාප්ත සේවාවන්ට හා ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධාරීන් වීම.

III රාජ්‍ය අංශ තුල පවතින ප්‍රමාණවත් වෘත්තීයමය නිපුණතාවයකින් යුත් නිලධාරීන්ගේ හිඟය හා අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සපුරා ගැනීමට නොහැකිවීම.

IV රට තුළ පවතින ආර්ථික අර්බුදකාරි තත්ත්වය යටතේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහය කළමනාකරණය කර ගැනිම.

V නව මහ බැංකු පනත අනුව 2023 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකු මූල්‍යකරණය සම්පූර්ණයෙන්ම අත්හිටුවන ලද අතර මූල්‍ය වෙළඳපොළ හරහා ණය සේවාකරණය සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනිම මගින් භාණ්ඩාගාර අරමුදල් ප්‍රවාහය කළමනාකරණය කර ගැනීමට සිදුවීම.

ඉදිරි ඉලක්ක

I ITMIS ව්‍යාපෘතිය තුළ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව අදාල මොඩියුල් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරිමට සහාය වීම.

II ජාතික / අන්තර්ජාතික මට්ටමේ ප්‍රමිතීන් දෙපාර්තමේන්තු අවශ්‍යතා මත ගලපා භාණ්ඩාගාර අරමුදල් කළමනාකරණ ක්‍රියාවලින් සඳහා ප්‍රමිති සහතිකයක් ලබා ගැනිම.

III විශ්ව විද්‍යාල ඇතුළුව විවිධ ව්‍යවස්ථාපිත නොවන රාජ්‍ය ආයතන විසින් පවත්වා ගෙන යනු ලබන භාණ්ඩාගාර අරමුදල්වලට අදාල නිල බැංකු ගිණුම් සියල්ලම භාණ්ඩාගාර කේවල ගිණුම් ක්‍රමය යටතේ ක්‍රියාත්මක කිරිමට පියවර ගැනිම.

IV 2023අයවැය යෝජනා ක්‍රියාවට නැංවීම යටතේ බදු නොවන සියළුම ආදායම් එකතු කිරීමේ ගිණුම් හරහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම වෙත දෛනිකව ලැබීම් සඳහා යාන්ත්‍රණයක් හඳුන්වා දීම.

එච්.සී.ඩී.එල්. සිල්වා
අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව



*රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පවත්වනු ලබන කාර්ය සාධන ඇගයීමේ වැඩසටහනේ දී සම්මාන ලබා ගැනීම*




*ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය (APFASL) විසින් සංවිධානය කරන හොඳම වාර්ෂික වාර්තා සහ ගිණුම් සම්මාන උළෙලේ 2020 රාජ්‍ය අංශය (දෙපාර්තමේන්තු කාණ්ඩය) සඳහා තෙවන ස්ථානය සඳහා ලෝකඩ සම්මානය ලබා ගැනීම*

# 03 පරිච්ඡේදය - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 | | සටහන | සත්‍ය 2023 | සත්‍ය 2022 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | **ආදායම් ලැබීම්** | | | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| 111,950,000,000 | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 391,279,705,499 | 154,776,282,088 | ඒසීඒ-1 |
| **111,950,000,000** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **391,279,705,499** | **154,776,282,088** | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 867,516,512 | 334,289,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 7,522,418,025 | 4,378,409,668 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 9,275,871 | 11,834,401 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **8,399,210,408** | **4,724,533,069** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **399,678,915,907** | **159,500,815,157** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | **192,754** | 110,642 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **399,678,723,153** | **159,500,704,515** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | | |
| 100,000,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 86,331,537 | 86,175,927 | ඒසීඒ-2(ii) |
| 4,031,015,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 2,432,772,841 | 4,216,336,322 | ඒසීඒ-2(ii) |
| 1,651,150,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 1,651,022,090 | 1,332,185,876 | ඒසීඒ-2(ii) |
| 2,754,000,000,000 | පොළී ගෙවීම් | 8 | 2,455,599,544,338 | 1,565,189,627,374 | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| **2,759,782,165,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **2,459,769,670,806** | **1,570,824,325,499** | |
| | **මූලධන වියදම්** | | | | |
| 2,200,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 1,604,895 | 980,900 | ඒසීඒ-2(ii) |
| 9,015,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 8,976,278 | 7,761,470 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 1,000,000 | හැකියා වර්ධනය | 14 | 902,100 | 808,101 | ඒසීඒ-2(ii) |
| 11,025,440,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 5,012,201,128,096 | 1,432,455,178,450 | ඒසීඒ-2(ii) |
| **11,025,452,215,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **5,012,212,611,369** | **1,432,464,728,921** | |
| | තැන්පතු ගෙවීම් | | 6,239,427,779 | 3,483,351,916 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 7,273,944 | 9,238,077 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **6,246,701,723** | **3,492,589,993** | |
| **13,785,234,380,000** | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 7,478,228,983,898 | 3,006,781,644,413 | |
| (13,785,234,380,000) | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (7,078,550,260,745) | (2,847,280,939,898) | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | (7,078,550,260,745) | (2,847,280,939,898) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | ඒසීඒ-3 |
| | | | - | - | |

1

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

### 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2023 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | තතාය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 95,279,613 | 82,007,706 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 16,936,122 | 18,938,049 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **112,215,735** | **100,945,755** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (5,710,885,717) | (4,425,893,543) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 95,279,613 | 82,007,706 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 5,727,821,839 | 4,444,831,592 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **112,215,735** | **100,945,755** |

පිටු අංක 1 සිට 39 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 40 සිට 45 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ....................... | ....................... | ....................... |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | |
| කේ.එම්.මහින්ද සිරිවර්ධන | එච්.සී.ඩී.එල්.සිල්වා | ඩී.ඒ.එස්.දොලේවත්ත |
| ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | අධ්‍යක්ෂ ජනරාල් | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| දිනය : 2024.02. 27 | දිනය : 2024.02. 27 | දිනය : 2024.02. 22 |

කේ.එම්.එම්. සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

එච්. සී. ඩී. එල්. සිල්වා
අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය,
කොළඹ - 01.

ඩී. ඒ. සමන්තා දොලේවත්ත
නියෝජ්‍ය අධ්‍යක්ෂ
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය,
කොළඹ - 01.

# 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන<br>2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | | |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 787,451 | 4,621,303 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 903,419,608 | 1,011,513,838 |
| අග්‍රිම ලැබීම් | 867,516,512 | 334,289,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 5,509,307 | 5,873,819 |
| තැන්පතු ලැබීම් | 3,153,405 | 3,081,009 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **1,780,386,283** | **1,359,378,969** |
| | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 110,435,210 | 111,156,634 |
| සහනාධාර සහ මාරුකිරීම් | 1,651,022,090 | 1,232,185,876 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 2,308,118 | 649,023 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 192,754 | 110,642 |
| අත්තිකාරම් ගෙවීම් | 4,413,083 | 4,686,012 |
| තැන්පතු ගෙවීම් | 3,153,405 | 3,081,009 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **1,771,524,660** | **1,351,869,196** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **8,861,623** | **7,509,773** |
| | | |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| මූලධන වියදම් | 8,861,623 | 7,509,773 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **8,861,623** | **7,509,773** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(8,861,623)** | **(7,509,773)** |
| | | |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **0** | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| | | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

3

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

## 3.5 ආදායම එකතු කිරීමේ කාර්ය සාධනය - 2023

| ආදායම් සංකේතය | විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව (රු.) | අවසන් ඇස්තමේන්තුව (රු.) | සත්‍ය ආදායම (රු.) | අවසාන් ආදායම් ඇස්තමේන්තුව ේ% ලෙස |
| 2002.01.99 | අනෙකුත් කුලී | 1,500,000,000.00 | 900,000,000.00 | 1,581,380,012.24 | 176 |
| 2002.02.01 | ණයදීම | 6,800,000,000.00 | 9,450,000,000.00 | 9,439,025,443.50 | 100 |
| 2002.02.99 | වෙනත් | 1,200,000,000.00 | 5,500,000,000.00 | 16,806,009,511.29 | 306* |
| 2003.01.00 | දෙපාර්තමේන්තුමය විකිණීම් | 70,000,000.00 | 100,000,000.00 | 158,732,020.11 | 159 |
| 2003.02.99 | විවිධ | 3,500,000,000.00 | 6,000,000,000.00 | 7,231,492,534.22 | 121 |
| 2003.03.02 | දඩමුදල් හා රාජසන්තක කිරීම් (වෙනත්) | 1,300,000,000.00 | 1,700,000,000.00 | 2,872,456,836.15 | 169 |
| 2003.05.00 | භාණ්ඩාගාර බැඳුම්කර අධිහාරය | 31,000,000,000.00 | 18,000,000,000.00 | 19,418,195,593.56 | 108 |
| 2003.99.00 | අනෙකුත් ලැබීම් | 18,000,000,000.00 | 8,500,000,000.00 | 27,058,002,760.35 | 318 ** |
| 2005.99.00 | ජාතික ලොතරැයි මණ්ඩලය හා අනෙකුත් පැවරීම් | 3,700,000,000.00 | 4,500,000,000.00 | 4,937,633,390.81 | 110 |
| 2006.04.00 | ණය ආපසු අයකර ගැනීම් | 16,000,000,000 | 45,300,000,000 | 276,274,960,094.03 | 610*** |
| 3001.01.00 | විදේශීය ප්‍රදානයන් | 6,900,000,000.00 | 11,400,000,000.00 | 24,803,439,297.60 | 218**** |
| 3001.02.00 | දේශීය ප්‍රදානයන් | 100,000,000.00 | 600,000,000.00 | 698,378,005.20 | 116 |

2023 වර්ෂයේ රට තුළ පැවති ආර්ථික සහ දේශපාලනික අර්බුද හමුවේ වසර ආරම්භයේ සකස් කරන ලද මුල් ඇස්තමේන්තු, 2023 වර්ෂයේ ප්‍රථම මාස හය තුළ ලද සත්‍ය ආදායම පදනම් කරගෙන සංශෝධනය කරන ලදී.

කෙසේ වෙතත්, වර්ෂය පුරාම රටේ ආර්ථිකයේ පැවති අස්ථාවරත්වය හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායම සහ සත්‍ය ආදායම අතර විචල්‍යතා සිදු වී ඇත.

* 2023 වසරේ මුල් මාස හය තුළ අමාත්‍යාංශ විසින් වාර්තා කරන ලද සත්‍ය ආදායමෙහි වර්ධනයක් ඇතිව තිබු බැවින් හා රජයේ අතිරික්ත ආදායම මුදල් වෙළඳපොලේ ආයෝජනය කිරීමෙන් ලද පොලී මුදල් මත සහ 2023.06.30 දිනට පැවති සැබෑ ආදායම මත පදනම්ව අවසන් ඇස්තමේන්තුව වැඩි කර ඇත. කෙසේ වුවද, 2023 වර්ෂය අග භාගය වන විට රාජ්‍ය ආදායම් රැස්කිරීම ඉහළ මට්ටමක පැවතීම නිසා


භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නිල බැංකු ගිණුම් තුළ පැවැති අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම නිසා පොලී ආදායම ඉහළ යාම හේතුවෙන් වෙනත් පොලී ආදායම වැඩි වී ඇත.

** 2023 වර්ෂයේ මුල් මාස 06 තුළ සත්‍ය ආදායම පදනම් කරගෙන ඇස්තමේන්තු සංශෝධනය කර ඇති අතර 2023 වර්ෂය අග භාගය වන විට අවසන් ඇස්තමේන්තුව සකස් කරන අවස්ථාවේ අපේක්ෂා නොකළ ආදායම් ලැබී ඇත.

*** 2023 වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරීමේ දි ඉන්දීය රේඛීය ණය යෝජනා ක්‍රමය සහ ලෝක බැංකු ණය ආධාර යටතේ යූරියා පොහොර ආනයනය කිරීම සඳහා ලබාදෙන ලද උප ණය යටතේ වූ ලැබීම්, SMILE III RF ණය යෝජනා ක්‍රමයේ 2023 වර්ෂය සඳහා අපේක්ෂිත මුදලට වඩා ණය අයදුම්පත් සංඛ්‍යාව වැඩි වීම සහ 2023 වර්ෂයේ දී ඇස්තමේන්තු නොකල SAPP ණය යෝජනා ක්‍රමයට අදාලව අයකරන ලද ණය වාරික ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම 2023 වර්ෂයේ මුල් ඇස්තමේන්තුවට ඇතුලත් නොවූ අතර එම ලැබීම් අවසන් ඇස්තමේන්තුවට ඇතුලත් කර ඇත.

කෙසේ වුවද, ඉන්දීය රේඛිය ණය යෝජනා ක්‍රමය යටතේ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ලබා දුන් රු. 228,770,919,566.31ක ( USD 700M) ණය මුදල 2022.12.31 දිනට පියවීමට තිබු නමුත් එය නියමිත දිනට නොගෙවීම නිසා 2023 වර්ෂයේදි එය හිඟ ආදායමක් ලෙස ගිණුම්ගත කරන ලදී. ඒ අනුව 2023 වර්ෂයේ අවසන් ඇස්තමේන්තු සකස් කරන අවස්ථාව වන විටදී එම ණය මුදල පියවීමේ කාලරාමුව නිශ්චිත නොවූ බැවින් ඇස්තමේන්තුවට ඇතුලත් නොකරන ලද නමුත් එම හිඟ ආදායම ලැබී ඇත. ලෝක බැංකු ණය අධාර වැඩ සටහන් මගින් යූරියා පොහොර බෙදාහැරීම සඳහා ලබාදෙන ලද වන උපණය යටතේ 2023 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තු සකස් කරන අවස්තාවේදි ගිණුම් ගත නොවූ රු. 2,114,353,124.50 ක මුදල 2023 වර්ෂය අවසාන වන විට ගිණුම් ගත වීම හා එම ණය මුදල සම්පුර්ණයෙන් භාණ්ඩාගාරය වෙත පියවිම යන හේතු නිසා ආදායම වැඩි වී ඇත.

****ද්‍රව්‍ය සහ උපකරණ ස්වරූපයෙන් ලද විදේශාධාර ඉහල යාම සහ සැලසුම් කළ ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘති සඳහා මුදල්මය විදේශාධාර උපයෝජනය ඉහල යාම හේතුවෙන් ආදායම ඉහළගොස් ඇත.



## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

රු. 000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| ***විසර්ජන පනත*** | | | | |
| පුනරාවර්තන | 57,412,280 | 57,662,165 | 10,708,541 | 18.57 |
| මූලධන | 12,100 | 12,215 | 11,483 | 94.01 |
| ණය සේවාකරණ | 5,470,000 | 5,470,000 | 4,639,336 | 84.81 |
| උප එකතුව | **62,894,380** | **63,144,380** | **15,359,361** | **24.32** |
| ***විශේෂ නීති සේවා*** | | | | |
| ණය සේවාකරණ | 4,157,090,000 | 13,722,090,000 | 7,456,622,921 | 54.34 |
| උප එකතුව | **4,157,090,000** | **13,722.090,000** | **7,456,622,921** | **54.34** |
| | | | | |
| මුළු එකතුව | **4,219,984,380** | **13,785,234,380** | **7,471,982,282** | **54.20** |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත්අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. 000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | මෙහෙයුම් කල්බදු ක්‍රමයට ප්‍රසම්පාදිත වාහන සඳහා වාරික ගෙවීම | 2137 | 2137 | 2137 | 100 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | විශ්‍රාම ගත් නිලධාරීන්ගේ ණය ශේෂ පියවීම | 171 | 171 | 171 | 100 |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

**රු. 000**

| වත්කම් කේතය | කේත විස්තරය | **31.12.2023** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | **31.12.2023** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 62,610 | 62,610 | - | 100 |
| 9153 | ඉඩම් | - | - | - | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | |
| 9180 | බදු දෙන ලද වත්කම් | 32,670 | 32,670 | | 100 |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම I

## 04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% -90% | 75% -89% | 50% -74% |
| වාර්ෂික අක්මුදල් සීමාවන් තීරණය කිරීම, එම සීමාවන් අදාළ රාජ්‍ය ආයතන වෙත දැනුම් දීමේ ක්‍රියාවලිය නිම කිරීමේ කාර්ය සාධන ප්‍රගතියේ ප්‍රතිශතය | 100% | | |
| ඉහත පරිදි ගණනය කරන ලද වාර්ෂික අක් මුදල් සීමාවන් මාසික පදනමින් සංශෝධනය කර අදාළ ආයතන වෙත දැනුම් දීමේ කාර්ය සාධන ප්‍රගතියේ ප්‍රතිශතය | 100% | | |
| දෙපාර්තමේන්තුව විසින් මාසික, ත්‍රෛමාසික, අර්ධ වාර්ෂික හා වාර්ෂිකව පිළියෙල කරනු ලබන විශේෂ ගිණුම් සාරාංශයන් සහ අදාළ වාර්තා, චක්‍රලේඛ උපදෙස් පරිදි අදාළ ආයතන වෙත නිශ්චිත දිනට හෝ එදිනට පෙර ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස | 100% | | |
| ඒකාබද්ධ අරමුදල කළමනාකරණය කිරීම මූලික කරගෙන භාණ්ඩාගාරය විසින් මුදල් වර්ෂය තුළ පවත්වනු ලබන භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ රැස්වීම් ගණන සහ එම රැස්වීම් වලදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස | 100% | | |



# 05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු දක්වන්න

| ඉලක්ක/අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50% - 74% | 75%-100% |
| වාර්ෂික අයවැය, සත්‍ය අරමුදල් ගලාඒම් සහ ගලායාම් බවට පත් කරමින් ඒකාබද්ධ අරමුදල කළමනාකරණය කිරීම | අදාළ පාර්ශවකරුවන් සමඟ සාමූහිකත්වයෙන් / සම්බන්ධීකරණයෙන්, ආර්ථිකව, කාර්යක්ෂම හා සඵලදායීව භාණ්ඩාගාර අරමුදල් ප්‍රවාහය කළමනාකරණය කිරීම | වර්ෂය තුළ පවත්වන ලද අරමුදල් ප්‍රවාහ රැස්වීම් සංඛ්‍යාව | | | 100% |
| උපණයවලට අදාළ ණය වාරික හා පොළී නියමිත දිනට අයකර ගැනීමට කටයුතු කිරීම | අයවියයුතු සියළුම ණය වාරික හා පොළී මුදල් අයකර ගැනීම | දෙපාර්තමේන්තු ඇස්තමේන්තුව අනුව අයකර ගත් ප්‍රතිශතය රු.බිලියන<br>I. වාරිකය - 276<br>II. පොළිය - 9.4 | | | 610%<br>100% |
| වියදම් දැරීමේ ආයතන වලට නියමිත අධිකාරියෙන් නව බැංකු ගිණුම් හා අග්‍රිම ගිණුම් ආරම්භ කිරීමට නිසි අනුමැතිය ලබා දීම හා ඒවා අධීක්ෂණය කිරීම | නව බැංකු ගිණුම් හා අග්‍රිම ගිණුම් විවෘත කිරීමට ඉදිරිපත් කරනු ලබන සුදුසු ඉල්ලීම් සඳහා බලය දීම තහවුරු කර ගැනීම | ලද අයදුම්පත් වලින් අනුමත කරන ලද අයදුම්පත් සංඛ්‍යාව | | | 100% |
| රජයේ නිලධාරීන්ගේ ණය ඇපකර යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබන සියළුම රජයේ නිලධාරීන්ගේ නොගෙවා ඇති ණය ශේෂයන් පියවීම | සුදුසුකම් ලබන සහ සම්පූර්ණ කරන ලද ණය අයදුම්පත්‍ර නියමිත ක්‍රියාවලියෙන් පසු සතියක් ඇතුළත ගෙවා නිම කිරීම | සතියක් තුළ නිරවුල් කරන ලද අයදුම්පත් සංඛ්‍යාවේ ප්‍රතිශතය | | | 100% |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.


තිරසර සංවර්ධන වැඩසටහන යටතේ හඳුනා ගන්නා ලද ඉලක්ක වර්ෂය තුළදී ඉහත පරිදි ඉටු කරගත් නමුදු ආර්ථික, දේශපාලනික, සමාජීය, නෛතික , තාක්ෂණික සහ පාරිසරික සාධකවලින් පැන නගින අභ්‍යන්තර හා බාහිර තත්ත්වයන් රජයේ අරමුදල් ප්‍රවාහය පාලනය කරනු ලබන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට අවශෝෂණය කර ගැනීමට සිදුවන බව නිරීක්ෂණය වේ.



# 06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය (2023.12.31)

| සේවා මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 25 | 16 | 09 |
| තෘතියික | 01 | 01 | - |
| ද්විතියික | 82 | 67 | 15 |
| ප්‍රාථමික | 20 | 15 | 05 |



**06.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.**

අනුමත කාර්ය මණ්ඩලයට සාපේක්ෂව තත්‍ය සේවක සංඛ්‍යාව අඩු බැවින් පුරප්පාඩු සංඛ්‍යාව ඉහළ යාම නිසා දෙපාර්තමේන්තුව සතු මානව සම්පත උපාය මාර්ගිකව අභිප්‍රේරණය කරමින් කළමනාකරණය කර දෙපාර්තමේන්තු අරමුණු ළඟා කර ගැනීම සෘජුවම හා දැඩි ලෙස අභියෝගකාරී වීම.

තත්‍ය කාර්ය මණ්ඩලය කාර්තු වශයෙන් වෙනස් වීම පහත පරිදි වේ.

| කාර්තුව | කාර්ය මණ්ඩලය | ජ්‍යෙෂ්ඨ | තෘතීය | ද්විතීක | ප්‍රාථමික | එකතුව |
|---|---|---|---|---|---|---|
| පළමු කාර්තුව | අනුමත | 26 | 1 | 80 | 20 | 127 |
| | ආරම්භක තත්‍ය | 19 | 01 | 72 | 13 | 105 |
| | ස්ථාන මාරුවී පැමිණි | 01 | - | 05 | 03 | 09 |
| | ස්ථාන මාරුවී ගිය | 02 | - | 07 | 02 | 11 |
| | තත්‍ය | 18 | 1 | 70 | 14 | 103 |
| | පුරප්පාඩු | **08** | **-** | **10** | **06** | **24** |
| දෙවන කාර්තුව | අනුමත | **26** | **1** | **80** | **20** | **127** |
| | ආරම්භක තත්‍ය | 18 | 01 | 70 | 14 | 103 |
| | ස්ථාන මාරුවී පැමිණි | - | - | 03 | 01 | 4 |
| | ස්ථාන මාරුවී ගිය | 02 | - | 04 | - | 6 |
| | විශ්‍රාම | - | - | 01 | - | 01 |
| | තත්‍ය | 16 | 1 | 68 | 15 | 100 |
| | පුරප්පාඩු | **10** | **-** | **12** | **05** | **27** |
| තෙවන කාර්තුව | අනුමත | **26** | **1** | **83** | **20** | **130** |
| | ආරම්භක තත්‍ය | 16 | 01 | 68 | 15 | 100 |
| | ස්ථාන මාරුවී පැමිණි | - | - | 01 | 01 | 2 |
| | ස්ථාන මාරුවී ගිය | - | - | 02 | - | 2 |
| | තත්‍ය | 16 | 1 | 67 | 16 | 100 |
| | පුරප්පාඩු | **10** | **-** | **16** | **04** | **30** |
| සිව්වන කාර්තුව | අනුමත | **25** | **1** | **82** | **20** | **128** |
| | ආරම්භක තත්‍ය | 16 | 01 | 67 | 16 | 100 |
| | ස්ථාන මාරුවී පැමිණි | - | - | 1 | - | 01 |
| | ස්ථාන මාරුවී ගිය | - | - | 01 | 01 | 02 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | තත්‍ය | 16 | 1 | 67 | 15 | 99 |
| | පුරප්පාඩු | **09** | **-** | **15** | **05** | **29** |

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම * |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය (රු.) | විදේශීය (ඇ.ඩො.) | | |
| MS Excel පුහුණු වැඩසටහන | 20 | දින 01 | - | - | දේශීය | නිලධාරින් වෙත ලබා දුන් පුහුණු මගින් උපයාගත් දැනුම, නිපුණතාවය, පළපුරුද්ද, න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව කාර්ය සාධනය ඉහල නංවමින් ආයතනික අරමුණු ළඟා කර ගැනීමට යෙදවීම. |
| මුදල් ප්‍රවාහ කළමනාකරණය | 65 | පැය 03 | - | - | දේශීය | |
| ගිණුම්ගත නොවූ විදේශ ණය පුහුණු වැඩසටහන | 30 | පැය 01 1/2 | - | - | දේශීය | |
| රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධ පුහුණු වැඩසටහන | 68 | පැය 02 1/2 | - | - | දේශීය | |
| පුහුණු කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | දින 03 | - | - | දේශීය | |
| "රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය පටිපාටි" පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | දින 05 | - | - | දේශීය | |
| "හිඟ මූල්‍යකරණය, ණය ගතිකය සහ ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික තත්වය" පිළිබඳ දැනුවත් කිරීම. | 76 | පැය 02 | · | - | දේශීය | |
| "රාජ්‍ය නිලධාරීන්ගේ සාමාන්‍ය විනය පවත්වාගෙන යාම" පුහුණු වැඩසටහන | 46 | පැය 03 | රු.3600/- | - | දේශීය | |
| කාර්යාභිවර්ධන වැඩමුළුව කාර්යාල පරිශ්‍රයෙන් බැහැරගත පුහුණු වැඩසටහන | 78 | දින 01 | - | - | දේශීය | |
| "අසම්භාව්‍ය බැරකම් හා ගෙවීම් ක්‍රමවේද | 01 | 01 | - | - | දේශීය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ප්‍රතිසංස්කරණ" පිළිබඳ පුහුණු වැඩසටහන | | | | | | |
| ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන | 01 | දින 21 | - | - | දේශීය | |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම * |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය (රු.) | විදේශීය (ඇ.ඩො.) | | |
| උපණය සහ භාණ්ඩාගාර බැරකම් අංශයේ කාර්ය භාරය පිළිබඳ පුහුණු වැඩසටහන | 80 | පැය 01 | - | - | දේශීය | නිලධාරින් වෙත ලබා දුන් පුහුණු මගින් උපයාගත් දැනුම, නිපුණතාවය, පළපුරුද්ද, න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව කාර්ය සාධනය ඉහල නංවමින් ආයතනික අරමුණු ළඟා කර ගැනීමට යෙදවීම. |
| ආදායම් අංශයේ කාර්ය භාරය පිළිබඳ පුහුණු වැඩසටහන | 80 | පැය 01 | - | - | දේශීය | |
| ප්‍රසම්පාදනය පිළිබඳ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන | 03 | පැය 03 | - | - | දේශීය | |
| අරමුදල් මෙහෙයුම් හා ගිණුම් අංශයේ කාර්ය භාරය පිළිබඳ පුහුණු වැඩසටහන | 80 | පැය 01 | - | - | දේශීය | |
| වරලත් ගණකාධිකාරිවරුන්ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන | 04 | දින 02 | - | - | දේශීය | |
| ක.සේ.නි. 1 පංතියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කිරීමේ පාඨමාලාව | 03 | දින 10 | - | - | දේශීය | |
| දේශීය හා විදේශීය ප්‍රදාන අංශයේ කාර්ය භාරය පිළිබඳ පුහුණු වැඩසටහන | 80 | පැය 01 | - | - | දේශීය | |
| ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ අංශයේ කාර්ය භාරය පිළිබඳ පුහුණු වැඩසටහන | 80 | පැය 01 | - | - | දේශීය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| විදේශීය ණය 1 හා විදේශීය ණය 11 අංශයන්හි කාර්ය භාරය පිළිබඳ පුහුණු වැඩසටහන | 80 | පැය 01 | | | දේශීය | |



*දිවා විවේක පුහුණු වැඩසටහන් යටතේ දෙපාර්තමේන්තුවේ තාක්ෂණික විෂයයන් පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීම*








*බැහැරගත පුහුණු වැඩසටහන - **2023.11.05***

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම * |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය (රු.) | විදේශීය (ඇ.ඩො.) | | |
| 2023 Asian Regional Public Debt Management Forum, ආසියානු සංවර්ධන බැංකුව,ඉන්දුනීසියාව. | 01 | දින 03 | | 160 | විදේශීය | නිලධාරින් වෙත ලබා දුන් පුහුණු මගින් උපයාගත් දැනුම, නිපුණතාවය, පළපුරුද්ද, න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව කාර්ය සාධනය ඉහල නංවමින් ආයතනික අරමුණු ළඟා කර ගැනීමට යෙදවීම. |
| Financial Development & Financial Inclusion, ජාත්‍යාන්තර මූල්‍ය අරමුදල, ඉන්දියාව. | 01 | දින 11 | | 325 | විදේශීය | |
| 13 Th Debt Management Facility Stakeholders Forum, ලෝක බැංකුව, ජර්මනිය. | 01 | දින 02 | | 100 | විදේශීය | |
| Implementing Modern Cash Management, ජාත්‍යාන්තර මූල්‍ය අරමුදල, ඉන්දියාව. | 01 | දින 05 | | 150 | විදේශීය | |
| 2023 IPSASB Strategy Roundtable & Public Sector Accounting Forum, ආසියානු | 01 | දින 02 | | 100 | විදේශීය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සංවර්ධන බැංකුව, පිලිපීනය. | | | | | | |
| 2023 Asian Regional Forum Investment Management of Foreign Exchange, ආසියානු සංවර්ධන බැංකුව, ඉන්දුනීසියාව. | 01 | දින 03 | | 125 | විදේශීය | |
| Advanced Government Finance Statistics, ජාත්‍යාන්තර මූල්‍ය අරමුදල, ඉන්දියාව. | 01 | දින 05 | | 150 | විදේශීය | |
| Advanced Seminar on Financial Leaders From the Perspective of the Belt and Road Initiatives, චීනය. | 01 | දින 08 | | 250 | විදේශීය | |
| Regional Conference on Community, ආසියානු සංවර්ධන බැංකුව, තායිලන්තය. | 01 | දින 04 | | 125 | විදේශීය | නිලධාරින් වෙත ලබා දුන් පුහුණු මගින් උපයාගත් දැනුම, නිපුණතාවය, පළපුරුද්ද, න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව කාර්ය සාධනය ඉහල නංවමින් ආයතනික අරමුණු ළඟා කර ගැනීමට යෙදවීම. |
| Seminar on Promoting Electric Mechanical Industry and Economic Development for Developing Countries, චීනය. | 01 | දින 14 | | 375 | විදේශීය | |
| Seminar for Machinery Industry Management Officials and Industry, චීනය. | 01 | දින 14 | | 375 | විදේශීය | |




- **ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

වාර්ෂික මානව සම්පත් සැලස්ම අනුව කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය වෙනුවෙන් පුහුණු වැඩසටහන් පවත්වන ලදී. දිවා විවේක පුහුණු වැඩසටහන් මාලාව යටතේ මෙම දෙපාර්තමේන්තුවට සුවිශේෂී වූ තාක්ෂණික විෂයයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 08ක් සහ රටේ පැවති තත්වය යටතේ නව ආර්ථික ප්‍රවණතා අනුව රාජ්‍ය මූල්‍ය ප්‍රවාහ කළමනාකරණය හා ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වන ලදී.

එසේම, දෙපාර්තමේන්තු විෂය පථයට අදාළව පැවති විවිධ විදේශ පුහුණු වැඩමුළු සහ සම්මන්ත්‍රණ වෙනුවෙන් නිලධාරීන් 11 දෙදෙනෙකු සම්බන්ධ කිරීමට හැකි විය. එම විදේශ වැඩමුළු සඳහා සහභාගී වූ සෑම නිලධාරියෙකුටම තමා ලබාගත් දැනුම කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සමඟ හුවමාරු කර ගැනීම සඳහා අවස්ථාව ලබා දී ඇත. සියළු පුහුණු වැඩසටහන් රාජ්‍ය වියදම් පාලනය කිරීමට අදාළ චක්‍රලේඛවලට අනුකූලව සිදු කරන ලදී.

මෙම සියළු දේශීය සහ විදේශීය වැඩසටහන් මඟින් නිලධාරීන්ගේ විෂයය කරුණු පිළිබඳ දැනුම හා කුසලතා මෙන්ම ආකල්ප සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වූ අතර එමඟින්, වෘත්තීමය නිපුණතාවයන් හා කුසලතාවයන්ගෙන් පූර්ණ වූ ද කාර්ය මණ්ඩලයක් ඇති කරගනිමින් කාර්යක්ෂම හා ගුණාත්මක සේවයක් ලබා දෙමින් 2023 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව වෙත පැවරුණු අභියෝග හා ඉලක්ක පහසුවෙන් ජය ගැනීමට හැකි විය.



## 07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **01** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | | |
| **02** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරිම (මූ.රෙ. 445)** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **04** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **05** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **06** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2), DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **07** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | කළමනාකරණ සේවා චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| **08** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිළ දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණයවූ අතිරික්ත, ඌණතා හා | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **09** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අදාල නොවේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයත් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල වේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබාදීම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛz අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම. | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | | |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No.
} පීඩී/ඒ/ටීඩී/එෆ්ඒ/2023/03

ඔබේ අංකය
உமது இல.
Your No.
}

දිනය
திகதி
Date
} 2024 මැයි 30 දින

ගණන්දීමේ නිලධාරි

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 249 - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

1. මූල්‍ය ප්‍රකාශන

**1.1** මතය

ශීර්ෂය 249 - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. ආදායම් කළමනාකරණය

#### 2.1.1 ආදායම් ඇස්තමේන්තු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂය සඳහා ආදායම් සංකේතාංක 12 ක් යටතේ රු.90,070,000,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සියළුම ආදායම් සංකේතාංකවල මූලික ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණි. ආදායම් සංකේතාංක 03 ක මුළු ආදායම් ඇස්තමේන්තු එකතුව රු.23,100,000,000 කින් අඩු කර තිබුණි. ආදායම් සංකේතාංක 09 ක මුළු ආදායම් ඇස්තමේන්තු එකතුව රු.44,980,000,000 කින් වැඩි කර තිබුණි. 2003.05.00 භාණ්ඩාගාර බැඳුම්කර අධිභාරය මුල් ආදායම් ඇස්තමේන්තුවේ සඳහන් රු.31,000,000,000 ක ආදායම රු.13,000,000,000 කින් අඩු කර ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණි. සමස්තයක් වශයෙන් දෙපාර්තමේන්තුව විසින් මුල් ආදායම් ඇස්තමේන්තුව අනුව රැස්කිරීමට අපේක්ෂා කර තිබූ ආදායම රු.21,880,000,000 කින් වැඩි කර ඇස්තමේන්තුව සංශෝධනය කර තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ආදායම් සංකේත 12 කින් රු.391,279,705,499 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අතරින් ආදායම් සංකේත 11 ක මුල් ආදායම් ඇස්තමේන්තු ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් ඇස්තමේන්තු කිරීම හා ඒවා සංශෝධනය කිරීම තාත්වික පදනමක් මත සිදු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව, සත්‍ය ආදායම සමඟ සැසඳීමේදී ආදායම් සංකේතාංක 7 කට අදාළව සියයට 59 සිට සියයට 510 ක් දක්වා පරාසය තුළ වෙනස් වී තිබුණ බව නිරීක්ෂණය විය.

#### 2.1.2 හිඟ ආදායම් රැස් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2023 දෙසැම්බර් 31 දිනට ආදායම් සංකේතාංක 08 කට අදාළව හිඟ හිටි ආදායම රු.2,434,967,737 ක් වූ අතර ඉන් වසරකට වඩා වැඩි හිඟ හිටි ආදායම රු.2,240,661,755 ක් වී තිබුණි.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති හිඟ ආදායමට සාපේක්ෂව 2023 දෙසැම්බර් 31 දින වන විට සමස්ත හිඟ හිටි ආදායම සියයට 100 අඩු වීමේ සිට සියයට 91 ක වැඩිවීමක් දක්වා වූ පරාසයක විචලනය වී තිබුණි.

(i) රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යාංශයේ ආදායම් සංකේත අංක 20.03.02.99 යටතේ 2018 දෙසැම්බර් 31 දිනට පෙර පැවැති සමුච්චිත හිඟ ශේෂය වූ රු.259,079 ක් ද 2020 වර්ෂයට අදාළ රු.232,927 ක් ද වශයෙන් එකතුව රු.492,006 ක වටිනාකම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ක්ෂය පදනම යටතේ ලබා දෙන කාර්යාල උපකරණ සඳහා අයවිය යුතු මුදලක් වූ අතර, එම මුදල අදාළ මන්ත්‍රීවරුන්ගේ පාර්ලිමේන්තුවට තේරී පත්වී නොමැති බැවින් හා මිය යෑම හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම හිඟ මුදල වසර 5ක පමණ කාලයක සිට ඉදිරියට එමින් පවතින අතර, මෙම මුදල අයකර ගැනීමට නොහැකි බැවින් මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව කපාහැරීම සඳහා 2024 ජනවාරි 17 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා තිබුණි.

(ii) ආදායම් සංකේත අංක 20.02.02.99 පොළිය (අනෙකුත්) යටතේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ 2020 දෙසැම්බර් 31 දිනට පෙර පැවැති රු.193,904 ක් සහ 2021 සිට 2023 දෙසැම්බර් 31 දක්වා පැවති රු.111,936 ක් ද වශයෙන් වූ එකතු වටිනාකම රු.305,840 ක් වූ හිඟ ණය ශේෂය අයකර ගැනීමේ හැකියාවක් නොමැති බවත්, ඒ අනුව මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව එම මුදල ඉවත් කිරීම සඳහා 2024 ජනවාරි 17 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් සිදු කර තිබූ බවත් නිරීක්ෂණය විය.

(iii) ආදායම් සංකේත අංක 20.06.04.00 ප්‍රාග්ධන ආදායම් - ණය ආපසු අයකර ගැනීම් යටතේ ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව හා සී/ස බදුල්ල දිස්ත්‍රික් සණස සංගමයට අදාළව 2018 දෙසැම්බර් 31 දක්වා පිළිවෙලින් රු.763,814,250 හා රු.111,114,479 ක් වශයෙන් එකතුව රු.874,928,729 ක හිඟ හිටි ආදායම් ශේෂයක් සහ ආදායම් සංකේත අංක 20.02.02.01 පොළිය-ණය දීම යටතේ උක්ත ආයතනයන්ට අදාළව පිළිවෙලින් රු.612,893,552 ක් හා රු.2,814,035 ක් සහ සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවා (ගැරන්ටි) ලිමිටඩ් සඳහා වූ රු.296,351,801 ක් වශයෙන් එකතුව රු.912,059,388 ක හිඟ පොළී ආදායමක්ද, 2018 වර්ෂයට

පෙර සිට ඉදිරියට එමින් පැවති අතර, මෙම ආදායම අයකර ගැනීම පිළිබඳව අවිනිශ්චිතභාවයක් පවතින බව නිරීක්ෂණය විය.

## 2.2. වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් එම ප්‍රතිපාදන වර්ෂය තුළ උපයෝජනය කළ පසු රු.1,596,901,410 ක ඉතිරියක් පැවති අතර, එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 සිට සියයට 57 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ආ) මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව සැසඳීමේදී වැය විෂයන් 8 කට අදාළව විචලතාවය සියයට 33 ක අඩුවීමේ සිට සියයට 568 ක වැඩිවීම දක්වා පරාසයක් තුළ වෙනස් ව තිබුණි.

## 2.3 තැන්පතු

සමාලෝචිත වර්ෂය තුළ ගනුදෙනු කිසිවක් සිදු නොවී පවත්වාගෙන යන, 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු.228,825,376 ක් වූ තැන්පත් ගිණුම් 12 ක් පැවතුණි. මෙම තැන්පත් ගිණුම් අතුරින් ගිණුම් 11 ක් විදේශ ප්‍රදාන ලැබීම්වලට අදාළ වන අතර, එක් තැන්පත් ගිණුමක් තෙවන පාර්ශවය වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු වලට අදාළ වේ.

## 2.4 බැරකම් හා බැඳීම් වලට එළඹීම

2023 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් ඇමුණුම iii යටතේ දක්වා තිබූ 2023 වර්ෂයේ බැරකම් ප්‍රකාශනයෙහි රු.235,957 ක 2023 වර්ෂයට අදාලව ගෙවිය යුතුව තිබූ බැරකම් අනාවරණය කර නොතිබුණි.

# 3 මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

### 3.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනිම

#### 3.1.1.1 රාජ්‍ය ණය ගිණුම්ගත කිරිම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2023 වර්ෂයේ හා 2022 වර්ෂය තුළ හෝ ඊට පෙර ප්‍රතිලබ්ධි වූ නමුත් 2023 වර්ෂය අවසන් වන විටත් ගිණුම්ගත නොකළ විදේශ ණයවල වටිනාකම පිළිවෙලින් රු.මිලියන 17,080.3 ක් හා රු.මිලියන 23.9 ක් වූ අතර, එහි මුළු වටිනාකම රු.මිලියන 17,104.2 ක් විය. එසේවුවද, විදේශීය රාජ්‍ය ණය වාර්තා කිරීමට භාවිතා කරන පරිගණක පද්ධතියේ CSDRMS 854-1 වාර්තාව හා රජයේ මූල්‍ය ප්‍රකාශන සන්සන්දනය කිරීමේදී මෙලෙස ගිණුම්ගත නොකළ විදේශ ණයවල 2023 දෙසැම්බර් 31 දිනට මුළු වටිනාකම රු.මිලියන 15,823 ක් විය. ඒ අනුව රු.මිලියන 1,281.1 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලි කිරීමේ සටහන් (Explanatory Notes) යටතේ සටහන් අංක 24(II) මගින් 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශීය ණයවල මුළු වටිනාකම රු.මිලියන 17,103.2 ක් ලෙස දක්වා තිබුණි. මෙලෙස සමාලෝචිත වර්ෂය තුළ මෙන්ම මීට පෙර වර්ෂවලදී ද ප්‍රතිලබ්ධි වී ඇති නමුත් ගිණුම්ගත නොකළ ණය වටිනාකම් පැවතීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇති විදේශ ණය වටිනාකම නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

(ආ) ණය අංක 2016035 අදාළව දෝෂ සහිත විනිමය අනුපාතිකයක් භාවිතා කිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට එම ණය වටිනාකම රු.මිලියන 962 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ණය අංක 2018003 අදාළව CSDRMS 854-1 වාර්තාවෙහි 2023 වර්ෂයට අදාළව කිසිදු ප්‍රතිලබ්ධිවීමක් නොමැති වුවද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(II) සහ අයවැය ක්‍රියාකාරීත්වය හා හිඟය මූල්‍යනය කිරීම යටතේ සටහන් අංක 11 අනුව EUR 727,053 ක් ප්‍රතිලබ්ධි වී ඇති බව දක්වා තිබුණි. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන ලද තොරතුරුවල ඇමුණුම 03 අනුව මෙම ණය මුදලට අදාළව 2022 වර්ෂය තුළ හෝ ඊට පෙර වර්ෂවල ප්‍රතිලබ්ධි වී 2023 වර්ෂය තුළ ගිණුම් ගත කරන ලද ණය වටිනාකම EUR 335,930 ක් පමණක් විය. ඒ අනුව මෙම ණයමුදලට අදාළව 2023 වර්ෂය තුළ ප්‍රතිලබ්ධි වීම් අතර EUR 391,123 ක වෙනසක් විය.

(ඈ) ණය අංක 2022011 අදාළව CSDRMS 854-1 වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය තුළ USD 131,000,000 ක් ප්‍රතිලබ්ධි වී තිබුණු අතර, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන ලද තොරතුරුවල ඇමුණුම 03 අනුව මෙම ණය මුදලට අදාළව පෙර වර්ෂවලදී ප්‍රතිලබ්ධි වී 2023 වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද ණය වටිනාකම USD 434,861 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ මෙම ණය ගිවිසුමට අදාළව ගිණුම්ගත කර ඇති මුළු ණය ලබා ගැනීම්වල වටිනාකම USD 131,434,861 ක් වුවද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල එය USD 133,765,136 ක් ලෙස දක්වා තිබුණි.

(ඉ) රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(II) සහ අයවැය ක්‍රියාකාරීත්වය හා හිඟය මූල්‍යනය කිරීම යටතේ සටහන් අංක 11 අනුව ණය අංක 2017034 අදාළව EUR 77,385 ක ඍන ප්‍රතිලබ්ධිවීමක් අන්තර්ගත කර තිබුණ ද, CSDRMS 854-1 වාර්තාවෙහි එවැනි ඍන ප්‍රතිලබ්ධිවීමක් දක්නට නොලැබුණි.

(ඊ) රජයේ මූල්‍ය ප්‍රකාශනවල අයවැය ක්‍රියාකාරීත්වය හා හිඟය මූල්‍යනය කිරීම යටතේ සටහන් අංක 11 හි පමණක් රු. මිලියන 5,081,046,724 ක ඍන ප්‍රතිලබ්ධිවීම් නිරීක්ෂණය විය.

(උ) රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24 (11) හි ඇතුළත් විදේශ ව්‍යවහාර මුදල් ඒකකය අනුව ආරම්භක ණය ශේෂයට සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිලබ්ධිවීම් එකතුවීමෙන් අනතුරුව හා සමාලෝචිත වර්ෂය තුළ ණය ගෙවීම් අඩු කළ පසු අවසාන ණය ශේෂයට සමාන විය යුතු වුවද, එලෙස සමාන නොවන ණය ගිවිසුම් 06කට අදාළව රු. මිලියන 107 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඌ) රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(1) න් ඉදිරිපත් කර ඇති විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ව්‍යාපෘති ණය ශේෂවලට (Foreign Currency Banking Unit Loan (Project) Balances) අදාළ CS-DRMS 854-1 වාර්තාව සමඟ පරීක්ෂා කිරීමේදී 2017045 දරන ණය ගිවිසුමට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට CS-DRMS 854-1 වාර්තාවෙහි සහ 2023 ජනවාරි 01 දිනට එම වාර්තාවේ USD 227,823 ක් හෙවත් රු.82,724,927 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, ණය ආපසු ගෙවීම් අතර ද USD 227,823 ක වෙනසක් නිරීක්ෂණය වුවද, එහි දේශීය මුදල් වටිනාකමෙහි කිසිඳු වෙනසක් නිරීක්ෂණය නොවීය. තවද, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව ආපසු ගෙවන ලද USD 332,704 ක මුදල දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමේදී USD 1 ක් රු.524.6050 ක් ලෙස අසාමාන්‍ය විදේශ විනිමය අනුපාතයක් යොදාගෙන ඇති බව නිරීක්ෂණය විය.

### 3.1.1.2 විදේශ ප්‍රදාන

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 05 විදේශ ප්‍රදාන (මුදලින් ලැබීම්) යටතේ සමාලෝචිත වර්ෂය තුළ ලද විදේශ ප්‍රදාන වියදමේ එකතුව රු.මිලියන 5,333 ක් ලෙස දක්වා තිබුණු අතර අදාළ තැන්පතු ලෙජර් අනුව එම වියදමේ එකතුව රු.මිලියන 5,302 ක් විය. මෙම වෙනස තුළ එකතුව රු.මිලියන 31 ක් වූ විදේශ ප්‍රදාන, අදාළ අරමුණට නොයොදවා සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය ආදායමට බැර වී තිබුණි.

(ආ) 2023 ජනවාරි 01 දින වන විටත් ශ්‍රී ලංකා රජය වෙත විශේෂ ප්‍රදාන ලෙස ලැබී ඇති නමුත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් අදාල අරමුණට නොයොදවා අක්‍රියව පැවති විදේශ ප්‍රදාන වටිනාකම රු.මිලියන 107.6 ක් විය.

(ඇ) 2019 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා විදේශ ප්‍රදානයන් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් එක් එක් විදේශ ප්‍රදානිත ආයතන 13 ක් සමග එකතු වටිනාකම් ජපන් යෙන් 984,000, යුරෝ 134,810,000, ඇමෙරිකානු ඩොලර් 58,417,841 කොරියන් වොන් 400,000, චීන යුවාන් 2,000,000,000 හා රු.4,545,750 ක් වූ විවිධ ව්‍යවහාර මුදලින් ගිවිසුම් වලට එළඹියද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම විදේශ ප්‍රදාන ලද බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවිනි.

### 3.1.1.3. උපණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනට රු.190,789,890,831 ක උපණය ශේෂයක් ලැබිය යුතුව පැවතුණි. අදාළ ආයතනය උපණය ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් සිදු නොකිරීම හේතුවෙන් ආයතන 03 කට අදාළව වසර 05 ක ට වඩා වැඩි රු.1,316,324,489 ක හිඟ උපණය ශේෂයක් පැවතුණි.

(ආ) 2023 දෙසැම්බර් 31 දිනට උප ණය වෙනුවෙන් ලැබිය යුතු පොළී වටිනාකම රු.9,439,025,443 ක් වූ අතර, ආයතන 03 කට අදාළව ගිවිසුම් ප්‍රකාරව නොගෙවූ වසර 05 කට වඩා වැඩි නොගෙවූ පොළී වටිනාකම් එකතුව රු.912,059,388 ක් වී තිබුණි.

(ඇ) 2023 ජනවාරි 01 දින වන විට ආයතන 2 ක ට අදාළ වූ උපණය ගිවිසුම් 4 ක් යටතේ පැවති උප ණය ශේෂ එකතුව වූ රු.114,487,221 කින් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු හිඟ මුදලක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) රජයේ මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ ආරම්භක සහ අවසාන දිනට වූ උපණය ශේෂයන්, ඊට අදාළ එක් එක් උප ණය ලබා දුන් ආයතනවලින් ලද ණය ශේෂ සනාථ කිරීමේ ලිපි අනුව වූ ශේෂයන් සමඟ සැසඳීමේදී විචලනයන් නිරීක්ෂණය විය. ඒ අනුව, රජයේ මූල්‍ය ප්‍රකාශනවල 2023 දෙසැම්බර් 31 දිනට උප ණය ශේෂය රු.මිලියන 78 ක් වැඩියෙන් දක්වා තිබුණි

(ඉ) රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට වූ උපණය ශේෂයන් හා අදාළ ආයතනයන්ගේ මූල්‍ය ප්‍රකාශන අනුව මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු උපණය ශේෂයන් සැසඳීමේදී ආයතන දෙකකට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල උප ණය ශේෂය රු.මිලියන 229 ක් අඩුවෙන් සටහන් වී තිබුණි.

### 3.1.1.4. භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2023 වර්ෂය තුළ හා ඊට පෙර කල් ඉකුත් වීම මත රු.මිලියන 168,541.48 ක් හා ඇ.ඩො. මිලියන 59.88 ක වටිනාකමින් යුතු භාණ්ඩාගාර ඇපකර 17 කට සහ රු.මිලියන 29,250 ක් හා ඇ.ඩො. මිලියන 200 ක වටිනාකමින් යුතු සහන ලිපි 9 කට අදාළව 2023 දෙසැම්බර් 31 දින වන විට නැවත වලංගු කාලය දීර්ඝ කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, බාහිර ආයතන වෙත අවස්ථා 10 ක දී නිකුත් කළ රු.මිලියන 115,977.35 ක් වටිනා භාණ්ඩාගාර ඇපකර සහ අවස්ථා 10ක දී නිකුත් කළ රු.මිලියන 28,838.4 ක් වටිනා සහන ලිපි 2023 දෙසැම්බර් 31 දින වන විට කල් ඉකුත් වී ඇති බවට නිරීක්ෂණය වූ අතර, ඒවායේ වලංගු කාලය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි.

### 3.1.1.5 දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන

සමාලෝචිත වර්ෂයේදී දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන යටතේ දේශීය ණය පහත පරිදි ප්‍රතිව්‍යුහගත කර තිබුණි.

(i). ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිලදී ගෙන තිබූ රු.2,368,416,351,609 ක භාණ්ඩාගාර බිල්පත් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජය වෙත ලබා දී තිබූ රු.344,728,000,400 ක අත්තිකාරම් මුදල, රු.220,797,000,000 වටිනා නව භාණ්ඩාගාර බිල්පත් සහ රු.2,492,347,352,009 ක් වටිනා නව භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කර තිබුණි.

(ii). එකතු වටිනාකම රු.3,204,461,897,219 ක් ව පැවති භාණ්ඩාගාර බැඳුම්කර 2023 සැප්තැම්බර් 14 දින නව භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කර තිබුණි.

(iii). ඇ.ඩො.788,237,384 ක් වටිනා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර 2023 අගෝස්තු 15 දින භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කර තිබුණි.

(iv). රජයේ දේශීය නීතිය යටතේ නිකුත් කරන ලද විදේශීය විනිමය බැංකු වලට අදාළව මහජන බැංකුවෙන් ලබා ගෙන තිබූ ඇ.ඩො.85,943,611 ක ණය මුදල 2023 නොවැම්බර් 11 දින භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කර තිබුණි.

(v). තවද, ඉහත නීතිය යටතේ ලංකා බැංකුවෙන් ලබාගෙන තිබූ ඇ.ඩො. මිලියන 240 ක විදේශීය විනිමය බැංකු ඒකක ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් 2023 නොවැම්බර් 02 දින අත්සන් කර තිබුණි.

**3.1.1.6 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය**

දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු යටතේ වන උපණය වලට අදාළ ණය වාරික හා පොළී, නියමිත දිනට අයකර ගැනීමට කටයුතු කිරීමේ අරමුණට අදාළව 2022 වර්ෂය තුළ ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් ලැබිය යුතුව තිබූ රු. බිලියන 228 ක මුදල ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ 2023 වර්ෂය තුළ අය කර ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් වර්ෂය තුළ ඉලක්ක ගත වාරික ආදායම සියයට 610 කින් ඉක්මවා තිබුණු අතර සැලසුම්ගත පරිදි ණය පොළී අයකර ගැනීමට කටයුතු කර තිබුණි.

**4. මානව සම්පත් කළමනාකරණය**

**4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ තනතුරු 09 ක් ද, ද්විතීයික මට්ටමේ නිලධාරී තනතුරු 15 ක් ද හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 05 ක් පුරප්පාඩුව පැවතුණි. විස්තර පහත පරිදි වේ.

| සේවක නාමය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු/ (අතිරික්ත) සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | | | |
| - අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - |
| - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 04 | 02 | 02 |
| - අධ්‍යක්ෂ | 09 | 08 | 01 |
| - නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | 11 | 05 | 06 |
| තෘතියික මට්ටම | 01 | 01 | - |
| ද්විතීයික මට්ටම | 82 | 67 | 15 |
| ප්‍රාථමික මට්ටම | 20 | 15 | 05 |
| | **128** | **99** | **29** |

(ආ) ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව යටතේ වැටුප් ලබන රියදුරෙකු 2023 අගෝස්තු 15 දින සිට දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරනු ලබන බව නිරීක්ෂණය විය.

බී.ඕ.ඩී.ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට